# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2270/64 - 2022 මාර්තු මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2022.03.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ හික්කඩුව නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

මියයාම හේතුකොට ගෙන හික්කඩුව නගර සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ හික්කඩුව නගර සභාවේ අංක 07 කටුකොලිහ කොට්ඨාසයට තේරී පත්වූ විනී කාරියවසම් අයත් වන්නාවූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සකු වී නොමැති අපේක්ෂකයකු, සභිකයකු වශයෙන් තෝරා පත් කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නා වූ එම හික්කඩුව නගර සභාවේ අංක 07 කටුකොලිහ කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා අලුත්ගෙදර වෙදරාලලාගේ විලාශිනී තක්ෂිලා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

හික්කඩුව නගර සභාවේ තේරීම් භාර නිලධාරි වේවැල්වල හේවගේ රවීන්ද්‍ර විජය කුමාර වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් අලුත්ගෙදර වෙදරාලලාගේ විලාශිනී තක්ෂිලා, හික්කඩුව නගර සභාවේ අංක 07 කටුකොලිහ කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත් කරගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**ඩබ්ලිව්. එච්. ආර්. විජය කුමාර,**
තේරීම් භාර නිලධාරි,
හික්කඩුව නගර සභාව.

2022 මාර්තු මස 09 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

EOG 03 - 0838


1A - G 36332 — 20 (2022/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*